

# පීඩිතයාගේ සුසුම

උස්තාද් කලි උල්ලාහ්
කලීලි ඇෆ්ගනිස්තානය

ඔවුහු මනුෂ්‍යත්වය
ඝාතනය කර දමා
එය දේශපාලනය යයි නම් කළහ.
පල් වෙච්ච මුද්‍රික එල
-වයින්" ලෙස හැඳින් වූහ.
මිනිසුන් තුළ වූ යහපත් වේශය
විනාශ කළහ..
එයයි, නියම දක්ෂතාවය

මගේ හදවත, හැම විටම
මගේ ශක්තිය හා සහයෝගයම විය.
මේ ලොවේ පැවැත්මට
එයම නිරිඳුන් විය, මට.
මගේ වික්ෂිප්ත භාවයට
හේතු සොයන කල්හි
සාක්ෂියට
කැඳවමි...දෙවියන්.
හදවතට මම කෘතඥ වෙමි.

උසස්ම සතුට
සහෘදයන්ගේ සමාහමයි
මරණයේ කලකණ්ණිකම
ඔවුන්ගෙන් අප වෙන් කරයි
අප, දුහුවිල්ලේ එක් වූ
කාලයේ සිට
ජීවිතයත්, මරණයත්
එකක්ම විය අපට,
කිසිම වෙනසක් නැති

අහා.. ජීවිතය යනු
හුස්ම සහ වේදනාව මිස
වෙන අන් කවරක්ද?
හදවතක්, වද හිංසනයක්,
කඳුලු පිරුණු ඇසක්....

දවසින් දවස නොවරදවාම
විඳ දරා ගැනීම,
මානසික ආතතිය හෝ
තවත් කෙනෙකුගෙ
යකඩ සපත්තුවකට
චප්ප වෙනවා මිසක

අපේක්ෂා බිඳුණු කෙනෙකුට
සතුට හෝ දුක
දැනෙන්නේ කෙලෙසද?
මරණයෙහි තිත්ත හෝ පැණි රසක් නැත
ස්වාධීනත්වය අරා සිටින ඔටුවා
මඩ ගොහොරුවක එරුණු විට
අපගේ ඉලක්කය
දුරද, ළඟද කියා සිතීම
වැඩකට නැති සිතුවිල්ලකි.

එක ලේ බිඳුවක්
පොළවට වැටුණු කල්හී
ස්වර්ගයේ මුදුවේ
වටිනා මැනිකක් ගිලිහෙයි.

ප්‍රවේශම් වන්න
කෲර පාලකයිනි,
මානසික පීඩාවෙන් හෙම්බත් වුණු
අනාථයෙකුගේ සුසුමක්
විනාශ කරනු ඇත,
ඔබගේ සර්වබලධාරී ඔටුන්න

පරිවර්තනය- පුෂ්පා රම්ලනී

# සමාරාධනා

දර්ශන මේදිස්

මෙහි එන්න
සහෝදර පිය.ඹ පිරිවර කැටුව පැමිනෙන්න
මගේ කවි අසපුවට පිවිසෙන්න

හිතවතුනි,
සමා වී ඉවසන්න
කැකුලු මල්වලට අත නොතබන්න
පිපුනු කුසුමක සුවඳ විඳගන්න

පෙම්වතුනි,
හැලූම්බර දෑස් පිසදාගන්න
ගුරොව් හා
ආන්නා සර්ගෙයව්නා කොහිද?
වැඩවසම් බැමි මුදාගෙන එන්න
ඔබේ පෙම අලූත් කරගෙන යන්න

බැතිමතුනි, පමා කිම?
මල් එපා හිස් අතින් පැමිනෙන්න
නිදි කිරා නෙවැටෙන්න
දැලි කඩා නැන පහන් දල්වන්න

ලදරුවෙනි, පිබිදෙන්න
කොටුඇඳෙන් බැස ඇවිත් බලපන්න
ඇතැම් කවි ලමයින්ට සුදුසු නැත
කමක් නෑ කියවන්න
කුඩා කල සිටම පැනසර වන්න

සිසුනි,
ගුරුවරුනි, කිම හෙම්බත්ව?
මල්මාල - තූර්ය වාදන කුමට?
පොත් බෙදාදෙන උලෙල නොවේ අද
විශය නිර්දේශ අකුලා එන්න
අලුත් තක්සලාවක් අරඹන්න

සොරුනි,
මංකොල්ලකරුවෙනි, එන්න
කලුවරේ
සෙමින් බර අඩි තබා ලං වන්න
සොරකමේ ආදිනව කියා නැත
මගේ කවියෙන් පාර අහගන්න
කිරීටය පැහැර ගන්නට යන්න

තරුන සොල්දාදුවෙනි, නවතින්න
පරන පව් ඇලෙන් සෝදා එන්න
සැබෑ සතුරා හැඳිනගෙන ඉන්න
මගේ කවි ගබඩාවෙ
අලූත් කවි තිබේ ඔබහට දෙන්න

ගොවි පුතුනි, ඇයි ඔතැන?
මඩ කලල් හනික පිසදා එන්න
කම්හලේ සොහොයුරෙනි,
යන්තරේ වැඩ නවත්වා එන්න
ගිනි ගලකි මගෙ කවිය
ඔබේ සිත් පන පොවාගෙන යන්න

*කඳුළු මිටියාවතින්*



# පහන් වැට

## තහනම් ඉසව්වක්

විසල් අහසක් යට
පොඩි පොඩි රෝස මල්
කොයි තරම් වටිනවද
බිම් තඹුරක්වත්
නොපිපෙනා වෙරළට

අඟුරු කන කොළඹ යන
යක්කුන්ගෙ එල්ලිලා
මොර දෙනා ලිහිණින්ගෙ
හූව කොලු කමටය
රෝස මලක් තුඩින් අරන්
උනුත් ඒවි හෙට මෙතනට

නිල ඇඳුම යට
හදවතක් ඇතිය යන
කතා හරි හුරතල්ය
ටෙලිවිෂන් තිරය මත
ජාතික පොලිස් දිනයට

කෙල්ලන්ගෙ නම් තිබුණාට
කෝච්චියෙ යකඩ හදමය
කාකි පැහැ පසුබිමට
රෝස මල නොගැළපේමය

නිල් අහස යට
වැහි අකුණු තිබෙන බව
තාම උන් නොදන්නෙය
රෝස කටුවේ දිගට
වෙඩි උණ්ඩ පිරවිය හැකිය

රළ ඇවිත් උසාවිය වෙත
සාක්කි නොදුන්නාට බයට
මත් ගඳට රත් ඇසට
මං බය නෑ තොපට

කාන්තා දිනවලට විතරක්
අහසට නැගෙන සඳතුමී
දුටුවාද කාකි පැහැ දියඹට
තාරකා වැටෙන සැටී

ගැමුණු පී. දසනායක

## කණ්අඩිය රිදෙනවා

අමිල ජයවන්ද්‍ර ලියනආරච්චි



පොඩිවෙච්චි හිත ගාව පාළුවේ උන්නා
තනිවෙච්චි දින ගාණ අමතකව තිබුනා
ඉගිලෙච්චි නුඹ තාම හැංගිලා ඉන්නා
පිච්චිච්චි ආදරයේ සීතලම ඕනා

ඇහිපිල්ලම් පියවෙන්න නොදී
පියාපත් සුළගේ විසිඋනා
වාරු නැතිවී තනිකඩයා
කල්පනා ලොවේ කල් පමා උනා

ලංවෙච්චි අරුමයක කරුමයට හුරුවෙච්චි
බට්ටිච්චි නොකියාම වළාකුළක නැංගා
ඇහැරෙච්චි හීනයක ලස්සනට මත්වෙච්චි
පොල්කිච්චි කන්පෙත්තෙ අඬ අඬා හිටියා

## එනතුරා වසන්තය

සුළගේ හඬට කන්දෙමි..
අඳුරු වු දහවලක
වසාඇති පන්සලේ
දොර අසල..
සාදුකාරය නගන.

බුදු පහන මිලානය
පර මල් අතර තනිවුන
තටු ගසන හඬ ඇසේ
ගේ කුරුල්ලෙක් අඳුරේ .

දරාගත නොහේදෝ  අහස් කුස..
සඟවන්න තැත්කරන කඳුළු පොද
වැගිරේය..
අකීකරු වී නිබඳ.

මල් කොළ හැලී අහේනිව
ගස්වැල් ඇත ඔහේ බලාගෙන
ඉඩදෙමින් වැහිබිඳට
රිසි ලෙසක ගලන්නට.

"""""දෝත පා වැහි දියට
පිපාසය නිවා ගමු
අකුණුසැර
එකතුකොට
උණුසුමට
පන පොවමු...

සුදුමැලිව ගිය
කොපුල්- කඳුළු වැල්
පිස දමමු..
මලසුනක මියැදුනු
වනමලින් ලොව දකිමු."""""

චන්ද්‍රිකා ද සිල්වා